**ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි පාඨමාලාව 2013,2014 අධ්‍යයන වර්ෂ සඳහා සිසුන් බඳවා ගැනීම (17වන කණ්ඩායම)**

**උපදෙස් පත්‍රිකාව**

රුහුණ විශ්වවිද්‍යාලයේ දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකයේ බාහිර උපාධි අපේක්ෂකයකු වශයෙන් ලියාපදිංචි වන සිසුන් සඳහා පහත උපදෙස් අදාළ වේ.

**ලියාපදිංචි වීමේ ක්‍රමවේදය**

ඉහත පාඨමාලාව ට ලියාපදිංචි වීමට අවශ්‍ය පෝරම ,ගෙවීම් වවුචරය සහ උපදෙස් පත්‍රිකාව රුහුණ විශ්වවිද්‍යාලයේ දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය වෙත පැමිණ හෝ මුද්දර ඇලවූ ඔබගේ ලිපිනය ලියූ 9"×4" ලියුම් කවරයක් ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී, දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය, රුහුණ විශ්වවිද්‍යාලය, වැල්ලමඩම, මාතර ලිපිනයට එවීමෙන් ලබාගත හැකි ය. සම්පූර්ණ කරන ලද අයදුම්පත, රු.1500.00 ක මුදලක් ගෙවන ලද වවුචරය සහ අ.පො.ස උසස් පෙළ ප්‍රතිඵල සහතිකයේ පිටපතක් ඉහත ලිපිනයට 2015.08.31 දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

ඔබ ලියාපදිංචි වන්නේ මාර්ගගත (Online) ක්‍රමයට නම් පහත උපදෙස් අදාළ වේ.

- ❖ මාර්ගගත ලියාපදිංචි වීම ආරම්භ කිරීමට ප්‍රථම පහත සඳහන් තොරතුරුවල විද්‍යුත් පිටපත් (electronic copies) ඔබ සතුව පවතී නම් එය ඉතා පහසුවෙන් සිදු කර ගැනීමට හැකියාව පවතී.
  - ✓ මුදල් ගෙවා ලබා ගත් ගෙවීම් වවුචරය
  - ✓ අ.පො.ස උසස්පෙළ ප්‍රතිඵල සහතිකය
  - ✓ 2" × 2 1/2" ප්‍රමාණයේ ඔබගේ උඩුකය වර්ණ පසුබිම සුදු ඡායාරූපයක්
  - ✓ උප්පැන්න සහතිකයේ පළමු පිටුව සහ දෙවන පිටුව
  - ✓ ඔබගේ නමෙහි වෙනසක් ඇත්නම් එය සහතික කිරීම සඳහා දිවුරුම් ප්‍රකාශයක්

  **මුදල් ගෙවීම් වවුචරය සහ අ.පො.ස උසස්පෙළ ප්‍රතිඵල සහතිකය හැර අනෙකුත් ලිපි ලේඛන පසුව ද ඉදිරිපත් කළ හැකි ය.**

- ❖ මාර්ගගත ලියාපදිංචි අයදුම්පත (online registration form) අප වෙබ් අඩවිය වන www.dceu.ruh.ac.lk වෙත පිවිස online registration මත click කිරීමෙන් ලබා ගත හැකි අතර එහි දී ඔබගේ මූලික තොරතුරු ලබා දී ලියාපදිංචි විය හැකි ය. මෙහි දී ඔබ විසින් ලබාදෙන රහස් පදය (password) ඉදිරි කටයුතු සඳහා මතක තබා ගැනීම අත්‍යවශ්‍ය වේ. තව ද, ඔබ විසින් ලබාදෙනු ලබන රහස් පදය අවශ්‍යතාවය පරිදි ඔබටම නැවත වෙනස් කර ගැනීමට ද අවස්ථාව ඇත. එසේ ම විද්‍යුත් ලියාපදිංචි අයදුම්පත පිරවීම සඳහා Unicode (Iskoola pota) සහ Times New Roman අකුරු වර්ග ඔබ විසින් භාවිත කරනු ලබන පරිගණකය/ජංගම දුරකථනය තුළ ස්ථාපනය කර ගැනීම අත්‍යවශ්‍ය වේ.
- ❖ ගෙවීම් වවුචරය නිවැරදි ලෙස පුරවා අයදුම්පත්‍ර ගාස්තුව වන රු.1500.00 ක මුදල මහජන බැංකුවේ බාහිර විභාග ගිණුම් අංක **032-1-001-1-2477594** අංකයට ඕනෑ ම මහජන බැංකු ශාඛාවකින් ගෙවිය හැකි ය. එම වවුචරය සහ ඉහත සඳහන් අනෙකුත් ලියකියවිලි සුපිරික්සවා (scan) හෝ පැහැදිලි ඡායාරූපයක් ලෙස ගෙන පරිගණක පද්ධතියට ගබඩා (upload) කළ යුතු ය. ඒ සඳහා www.dceu.ruh.ac.lk වෙබ් අඩවිය වෙත පිවිස Login to your account මත click කිරීමෙන් ලැබෙන මුහුණතෙහි (interface) user name එක සඳහා ඔබගේ ජාතික හැඳුනුම්පත් අංකය (උදා: 750540250v) සහ password එක සඳහා ඔබ විසින් ලියාපදිංචි වීමේ දී ලබා දුන් රහස් පදය ඇතුලත් කළ යුතු ය. එහි දී ලැබෙන අතුරු මුහුණතේ (interface) ඔබ විසින් ලියාපදිංචි වීමේ දී ලබා දුන් තොරතුරු ප්‍රදර්ශනය වන අතර වම් පස තීරුවේ ඇති upload documents මත click කිරීමෙන් දක්නට ලැබෙන Add New බොත්තම (button) මත click කිරීමෙන් ලැබෙන අතුරු මුහුණත භාවිතයෙන් අවශ්‍ය සහතිකවල විද්‍යුත් ලිපිගොනු (scaned copy or photos) අපගේ server එකෙහි ගබඩා (upload) කළ හැකි ය.
- ❖ **සැ.යු - මාර්ගගත ක්‍රමයට ලියාපදිංචි වන සිසුන් ලියාපදිංචි ගෙවීම් වවුචරය සහ උසස් පෙළ සහතික පත් වල විද්‍යුත් පිටපත් පරිගණක පද්ධතියට ගබඩා කර ගැනීමට නොහැකි නම් එම ලිපි ලේඛන ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී, දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය, රුහුණ විශ්වවිද්‍යාලය, මාතර. යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය හැකි ය.**

❖ ඉල්ලුම්පත් පිරවීමේදී ඇතිවන ගැටලු මඟ හරවා ගැනීමට අයදුම්පත්‍රයේ ඇති උපදෙස් අනුගමනය කළ යුතු අතර, එසේ නොහැකි වූ අවස්ථාවලදී පමණක් අප ඒකකය මගින් දැනුවත් විය හැකි ය.

❖ අයදුම්පත් ප්‍රමාණය අපේක්ෂිත ප්‍රමාණයට වඩා වැඩිවුවහොත් අභියෝගතා පරීක්ෂණයක් මගින් හෝ සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුසුකම් සපුරනු ලබන අයදුම්කරුවන් පමණක් රුහුණ විශ්වවිද්‍යාලයේ බාහිර උපාධි අපේක්ෂයෙකු ලෙස බඳවා ගනු ලැබේ.

**ලියාපදිංචි වීමට අවශ්‍ය සුදුසුකම්**

- ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී විෂයයන් තුනකින් එකවර සමත් විය යුතු ය.

නැතහොත්,

**රුහුණ විශ්වවිද්‍යාලය විසින් පිළිගෙන ඇති පහත සඳහන් සුදුසුකම් වලින් එකක් ලබා තිබීම.**

(අ) පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම.

(ආ) කොළඹ බණ්ඩාරනායක ජාත්‍යන්තර අධ්‍යයන ආයතනයේ ඩිප්ලෝමා පරීක්ෂණයෙන් සමත් වීම.

(ඇ) ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ අවසාන පරීක්ෂණයෙන් සමත් වීම.

(ඈ) ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමිතියේ ප්‍රාචීන මධ්‍යම පරීක්ෂණයෙන් සමත්වීම.

(ඉ) අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ගුරු සහතිකය ලබා තිබීම.

(ඊ) ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ අවසාන පරීක්ෂයෙන් සමත්වීම.

(උ) සේවක අධ්‍යාපන ආයතනයේ ඩිප්ලෝමා පරීක්ෂණයෙන් සමත්වීම.

සහ

❖ රුහුණ විශ්වවිද්‍යාලයේ දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය මගින් පවත්වනු ලබන අභියෝගතා පරීක්ෂණය සමත් වීම. (අපේක්ෂිත සිසුන් ප්‍රමාණයට වඩා අයදුම්පත් වැඩිවුවහොත් පමණක් අභියෝගතා පරීක්ෂණයක් පවත්වනු ලැබේ.)

**සැ.යු : ලියාපදිංචි වීම සඳහා සම්පූර්ණ කළ යුතු මූලික සුදුසුකම් නොමැති නම් ඔබට රුහුණ විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂකයෙකු ලෙස ලියාපදිංචි වීමේ අවස්ථාව අහිමිවනු ඇත. තව ද ඔබ විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු සාවද්‍ය වුවහොත් ඔබගේ ශිෂ්‍ය ලියාපදිංචිය අවලංගු වනු ඇත.**

**උපාධි පාඨමාලාව සම්බන්ධ තොරතුරු**

❖ ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි පාඨමාලාව අධ්‍යයන වර්ෂ තුනකින් සමන්විත වේ.

❖ අධ්‍යයන වර්ෂ පිළිවෙලින් 1000, 2000, සහ 3000 යන ස්ථල වශයෙන් නම් කොට ඇත.

❖ දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකයේ අධ්‍යයන මණ්ඩලයේ නිර්දේශය මත සනාතන සභාව විසින් එක් එක් වර්ෂයේදී උපාධි පාඨමාලාව සඳහා ලියාපදිංචි කරගන්නා සිසුන් සංඛ්‍යාව තීරණය කරනු ඇත.

❖ බාහිර අපේක්ෂකයෙකු වශයෙන් ලියාපදිංචි වීම සඳහා නියම කර ඇති සුදුසුකම් අයදුම්පත් කැඳවන අවසන් දින වනවිට සම්පූර්ණ කර දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය මගින් පවත්වනු ලබන අභියෝගතා පරීක්ෂණය සමත් වූ අයදුම්කරුවන් පමණක් එම අධ්‍යයන වර්ෂයේ ලියාපදිංචිය ලැබීමට සුදුසුකම් ලබයි. (අපේක්ෂිත සිසුන් ප්‍රමාණයට වඩා අයදුම්පත් වැඩිවුවහොත් පමණක් අභියෝගතා පරීක්ෂණයක් පවත්වනු ලැබේ.)

❖ බාහිර උපාධි අපේක්ෂකයෙකු වශයෙන් ලියාපදිංචි වන ඔබ සඳහා , බාහිර ශිෂ්‍ය වාර්තා පොතක් නිකුත් කරනු ලැබේ.

❖ ලියාපදිංචිය සිදුකරන දින සිට වර්ෂ තුනක් (03) ක් අවසාන වන තුරු ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර අපේක්ෂකයෙකුගේ ලියාපදිංචිය වලංගු වනු ඇත.

බාහිර අපේක්ෂකයෙකුගේ ලියාපදිංචිය වලංගු කාලසීමාව ඉකුත් වූ පසු, එය කල් ඉකුත් ලියාපදිංචියක් සේ සලකනු ලැබේ. එබඳු බාහිර අපේක්ෂකයෙකු හට ලියාපදිංචියට අදාළ පරීක්ෂණයට පෙනී සිටීමට අයිතියක් නැත. එම නිසා, සෑම අපේක්ෂකයෙකු ම තම ලියාපදිංචිය ඉකුත් වූ වහා ම, එළඹෙන වර්ෂයේ ලියාපදිංචි කිරීමේ කටයුතු විශ්වවිද්‍යාලය මගින් ආරම්භ කළ විට, එය අලුත් කර ගැනීමට නියමිත ආකෘති පත්‍රය මගින් දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරිගෙන් ඉල්ලුම් කළ යුතු ය. මෙලෙස ලියාපදිංචිය දීර්ඝ කර ගත හැකි වන්නේ ලියාපදිංචි වර්ෂයේ සිට වසර 10ක් දක්වා පමණි.

**තව ද ලියාපදිංචිය අවලංගු කරවා ගැනීමට කරනු ලබන ඉල්ලීමකදී ලියාපදිංචි ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.**

**සාමාන්‍ය ශාස්ත්‍රවේදී උපාධිය හා සම්බන්ධ විෂයයන්**

| | |
|---|---|
| සමාජ විද්‍යාව | ආර්ථික විද්‍යාව |
| සිංහල | භූගෝල විද්‍යාව |
| බෞද්ධ සංස්කෘතිය | දේශපාලන විද්‍යාව |
| සංඛ්‍යානය | ඉතිහාසය |
| පාලි | |

ඉහත විෂයයන් අතරින් ඉතිහාසය විෂයය තෝරා ගන්නා සිසුන් සඳහා ලංකා ඉතිහාසය අනිවාර්ය වන අතර ඉන්දීය ඉතිහාසය හෝ යුරෝපා ඉතිහාසය විෂයය දෙකෙන් එකක් තෝරා ගැනීම ඔබ විසින් සිදු කළ යුතු ය.

**පාඨමාලා සම්බන්ධ තොරතුරු**

ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි පාඨමාලාව සඳහා පහත පරීක්ෂණ වර්ෂයක් පාසා පවත්වනු ලැබේ. ඒ සඳහා අදාළවන විභාග ගාස්තු ලියාපදිංචි වීමේදී දන්වනු ලැබේ.

ප්‍රථම ශාස්ත්‍ර පරීක්ෂණය

ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) ප්‍රථම භාග පරීක්ෂණය

ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) ද්විතීය භාග පරීක්ෂණය

- ✓ ලියාපදිංචි වී අධ්‍යයන වර්ෂයක් අවසානයේ ප්‍රථම ශාස්ත්‍ර පරීක්ෂණය පැවැත් වේ.
- ✓ ප්‍රථම ශාස්ත්‍ර පරීක්ෂණය සමත්වීමෙන් පසුව පමණක් ප්‍රථම භාග හා ද්විතීය භාග පරීක්ෂණයන් සඳහා පිළිවළින් පෙනී සිට උපාධිය සම්පූර්ණ කිරීමට අවස්ථාව ඇත.
- ✓ ප්‍රථම ශාස්ත්‍ර පරීක්ෂණයට සහ ද්විතීය භාග පරීක්ෂණයට පෙනී සිටීමට අවසර ඇත්තේ වාර තුනක් පමණි.
- ✓ ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධිය සම්පූර්ණ කර ගැනීම සඳහා විද්‍යාර්ථියෙකු ලියාපදිංචි වී අවම වශයෙන් අධ්‍යයන වර්ෂ තුනක කාලයක් ගත වේ.

**ඉගනුම් සම්පත්**

එක් එක් විෂයය සඳහා දැනුම ලබාදීමට විධිමත් දේශන, සාකච්ඡා, පුනරීක්ෂණ, නිබන්ධන, පරිගණක පාදක හා මාර්ගගත ඉගෙනීම් (computer based and online learning) ආධාරක ක්‍රමය භාවිත කරනු ඇත. මෙහි දී ආචාර්යවරයා විසින් සිදුකරනු ලබන දේශනය සහ අදාළ අත් පත්‍රිකා අන්තර්ජාලය මගින් ලබා ගැනීමට ඔබට හැකිවනු ඇත. තව ද එක් විෂය කොටසක් සඳහා ප්‍රතිපෝෂක සම්මන්ත්‍රණ එක් දිනයක පැවැත්වෙන අතර, එහි දී ආචාර්යවරුන් වෙත ප්‍රශ්න ඉදිරිපත් කිරීම, සාකච්ඡා කිරීම් යන ආදියට අවස්ථාව ලැබෙනු ඇත.

අධ්‍යක්ෂ,
දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය,
රුහුණ විශ්වවිද්‍යාලය.